## සංවර්ධනය නොකළ ඉඩම් මත බදු ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලිය



## 06.1 හැඳින්වීම

කිසියම් ඉඩමක් කවර හෝ ආර්ථික කාර්යයකට යෙදවීමෙන් වැළකී සිටීමෙන් අදාළ ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනයට සිදු වන හානිය විශාලය. මේ තත්ත්වය දිගින් දිගටම පැවතීම වළක්වා ගැනීම අරමුණු කරගෙන මේ බද්ද නියම කිරීමට නෛතික ප්‍රතිපාදන සලස්වා ඇත. පළාත් පාලන ආයතනවලට අය කර ගැනීමට නීතිමය ප්‍රතිපාදන සලස්වා දී තිබෙන ස්වයං උත්පාදන ආදායම් අතරින් ". . . . සභාව විසින් නියම කර අය කර ගත යුතු ය." යනුවෙන් සඳහන් එකම ආදායම් වර්ගය මේ සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද වේ. ප්‍රාදේශීය සභාව විසින් තීරණය කළ යුතු වන්නේ සංවර්ධනය නොකළ ඉඩම හඳුනාගැනීමේ ක්‍රමවේදය සහ එකී ඉඩම මත අයකළ යුතු වන බදු ප්‍රතිශතය කුමක් ද යන්න පමණකි.

## 06.2 නෛතික අධිකාරිය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තිය.

## 06.3 සුදුසුකම්

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් ඉඩමක් සාධාරණ වියදමකින් සංවර්ධනය කළ හැකි ව තිබෙන අවස්ථාවක -

(අ) ඒ ඉඩමෙහි කිසිම ගොඩනැගිල්ලක් ඉදි කර නොමැති අවස්ථාවක; හෝ

(ආ) ඒ ඉඩම වියිමත් හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති අවස්ථාවක; හෝ
නැතහොත්,

(ඇ) ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන පරිදි, සැබැවින්ම ඒ ඉඩමේ ඇති ගොඩනැගිලිවලින් ආවරණය වූ භූමි ප්‍රමාණය, ඒ ඉඩමේ මුළු බිම් ප්‍රමාණය අතර අනුපාතයට වඩා අඩු ප්‍රමාණයක පවතින විට,
ඒ ඉඩම, සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද ගෙවීමට යටත් වේ.

## 06.4 ගාස්තුව

ඒ ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් මහ සභාව තීරණය කරනු ලබන ප්‍රතිශතයට සමාන මුදල.

සටහන:

i. බද්ද අය කිරීමට මහා සභාව තීරණය කළ යුතු ප්‍රතිශතය 2 % ක ප්‍රමාණය නොඉක්මවිය යුතු ය.

ii. ප්‍රාග්ධන බිම් අගය යනු ඒ ඉඩම සියලු උකස් කිරීම්, බදු දීම්, බැඳීම් හෝ වෙනත් අයභාරවලින් තොරව, ගොඩනැගිලි හැර ඒ ඉඩම විවෘත වෙළෙඳ පොළෙහි විකුණන විට ගෙවනු ලබන මුදල අදහස් වේ.

## 06.5 කාර්යය පටිපාටිය

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|---|
| 1 | සංවර්ධනය නොකළ බදු ප්‍රතිශතය තීරණය කිරීමේ මහ සභා තීරණය ගැනීම සහ ඒ තීරණය ගැසට් පත්‍රයේ පළ කිරීම | සෑම වර්ෂයක ගැසට් නිවේදනය දෙසැම්බර් මස 31 වන දිනට පෙර | සභාපති |
| 2 | සංවර්ධනය නොකළ ඉඩම් හඳුනාගැනීම | සෑම වර්ෂයක ම මාර්තු 31 දිනට පෙර | ආදායම් පරීක්ෂක |

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|---|
| 3 | සංවර්ධනය නොකළ ඉඩම් මත බද්දට යටත් ඉඩම් ලේඛනය පිළියෙළ කිරීම | සෑම වර්ෂයක ම මාර්තු 31 දිනට පෙර | විෂය භාර නිලධාරි |
| 4 | සංවර්ධනය නොකළ ඉඩම විධිමත් ආකාරයෙන් තක්සේරු කිරීම | | තක්සේරු නිලධාරි/ බලයලත් නිලධාරී |
| 5 | සංවර්ධනය නොකළ ඉඩම අයිතිකරුට බදු නිවේදනය නිකුත් කිරීම | සෑම වර්ෂයක ම අප්‍රේල් මස 30 වන දිනට පෙර | ලේකම් |
| 6 | බද්ද අය කරගෙන ලදුපතක් නිකුත් කිරීම | නිවේදනයේ දින සිට දින 7 ක් ගත වීමට පෙර | පෙරටු කාර්යාල නිලධාරි / මුදල් අයකැමි |

සටහන: බදු නිවේදනය ඇමුණුමට අනුව පිළියෙළ කර ගත යුතු ය.

## 06.6 ගෙවීම පැහැර හැර ඇති විට කාර්යය පටිපාටිය

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|---|
| 1 | චංචල දේපළ තහනමට ගැනීමේ බලපත්‍රය නිකුත් කිරීම | නිවේදනයේ දින සිට දින 10 ක් ගත වීමට පෙර | ලේකම් |
| 2 | චංචල දේපළ තහනමට ගැනීම / තහනමට ගත හැකි චංචල දේපළක් නොමැති විට, නිශ්චල දේපළ තහනමට ගැනීමට අධිකරණ ක්‍රියා මාර්ග ගැනීම | බලපත්‍රය නිකුත් කළ දින සිට දින 30 ක් ගත වීමට පෙර | ආදායම් පරීක්ෂක |